# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2068/25 - 2018 අප්‍රේල් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව දුනු විදීමේ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, තාවකාලික කාර්යක්‍රමයක් වශයෙන් එකී ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) වන හේරත් මුදියන්සේලාගේ බුවනෙක පද්මකුමාර හේරත් මහතා 2018.04.26 වන දින සිට නිසි බලධරයා වශයෙන් පත්කරන අතර, ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමයේ 2018/2020 වර්ෂය සඳහා නව නිළධාරි මණ්ඩලය පත්කර ගැනීම පිණිස නිලවරණය කැඳවීමට හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

ෆයිසර් මුස්තෆා (පා.ම)
ක්‍රීඩා අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

05 - 233

1A - G 27520 — 12 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*